

**සභාපති තෝමස් එස් මොන්සන් විසින**
*සභාපති තෝමස් එස් මොන්සන්*

# කටයුතු කිරීමට කැඳවීම

අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් එංගලන්තයේ "ගැලවීමේ දොරටුව විවෘත කිරීමට" ධර්මදූතයෙක් ලෙස සේවය කිරීමට වැඩිහිටි හීබර් සී. කිම්බල් (1801-68) කැඳවූ විට, තමන් මෙම කටයුත්ත සඳහා නුසුදුසු යැයි වැඩිහිටි හීබර් සී. කිම්බල් ප්‍රබල ලෙස හැඟුනේය.

"අහෝ, ස්වාමීනි" ඔහු මෙසේ ලීවේය, "මම කතා කරනවිට ගොතගසන මිනිසෙකු වන අතර, ස හ සම්පූර්ණයෙන්ම එවන් කටයුත්තක් සඳහා නුසුදුස්සෙක් වන්නෙමි."

කෙසේ නමුත් වැඩිහිටි කිම්බල් කැඳවීම පිළිගත්තේය, ඔහු පවසයි: "එම හැඟීම් මාගේ කටයුත්ත ඉෂ්ටකිරීමේ මාර්ගයට බාධාවක් නොවීය; මාගේ ස්වර්ගික පියානණ්වහන්සේගේ කැමැත්ත මා හට වැටහුනු මොහොතේම, උන්වහන්සේගේ සර්වබලධාරී බලය තුලින් උන්වහන්සේ මා හට සහයදෙන බව විශ්වාසයෙන් සියලු උවදුරු වලට මුහුණ දෙමින් ඉදිරියට යෑමට අධිෂ්ඨානය සහ මා හට අවශ්‍ය සෑම සුදුසුකමක්ම ලැබෙන බවට හැඟුනේය."[1]

පූර්ණකාලීන ධර්මදූත සේවයට කැඳවා ඇති මාගේ තරුණ සහෝදර සහෝදරියණි, ඔබව කටයුතු කිරීමට කැඳවා තිබෙන්නේ මන්ද, ඔබ සුදුසු හා සූදානම් ෙ හයින් සහ ඔබ වැඩිහිටි කිම්බල් මෙන්, "දෙවියන්ව හන්සේට සේවය කිරීමට ආශාව ඇති" (ඩී සහ සී 4:3) තැනැත්තෙක් වන හෙයින්ය.

ජ්‍යෙෂ්ඨ යුවල්, ඔබ ද ඒ හා සමාන හේතු සඳහා කටයුතු කිරීමට කැඳවනු ලැබේ. ඔබ, කෙසේ වෙතත්, සේවය කිරීමට ඇති ආශාව පමණක් නොව, ආදරය, අත්දැකීම් සහ ජීවිතකාලය පුරා කැපකිරීම් තුලින් ලබා ගත් ප්‍රඥාව ද ගෙන එන්නේය. එවන් දෑ, ඔබගේ ස්වර්ගික පියානණ්වහන්සේ, සත්‍ය සොයන උන්ව හණ්සේගේ පුතුන්ගේ සහ දියණියන්ගේ හදවත ස්පර්ශ කිරීමට භාවිතා කරනසේක. අන්‍යයට සේවය කිරීම තුලින් උන්වහන්සේට සේවය කිරීමෙන් පමණක් බව අපට කිසිදාකත් ස්වාමීන්වහණ්සේට සත්‍ය ලෙස ප්‍රේමය කළ නොහැක බව නිසැකවම ඔබ එය ඉගෙනගෙන ඇත.

ධර්මදූතයන් ලෙස සේවය කිරීමට ඇති ඔබගේ ආශාවට අමතරව ඔබ, ඇදහිල්ල හා ධෛර්යය, නිර්බීත බව හා ආත්ම විශ්වාසය, ස්ථිර හා නොසැලෙන බව, අධිෂ්ඨානය හා කැපවීම යන දෑ එක්කරන්න. කැපවීමෙන් යුතුව ධර්මදූත මෙහෙවරේ යෙදෙන ධර්මදූයන් හට ආශ්චර්‍යයන් සිදුකිරීමට හැකිවනු ඇත.

සභාපති ජෝන් ටේලර් (1808-87) ධර්මදූතයන්ගේ අත්‍ය වශය ගුණාංගයන් මේ ආකාරයට සාරාංශ ගත කලේය: "මෙම ශුභාරංචි පණිවුඩය බෙදාගැනීමට අපට අවශය අන්දමේ පුරුෂයන් [සහ ස්ත්‍රීන් ස හ විවාහ යුවල්] වන්නේ නම්; පුද්ගලයන් දෙවියන්ව හන්සේ තුල ඇදහිල්ල ඇති; පුද්ගලයන් ඔවුන්ගේ ආගම තුල ඇදහිල්ල ඇති; පුද්ගලයන් ඔවුන්ගේ පූජකවරයට ගරුකරන; මෙවන් පුද්ගලයන් … දෙවියන්වහන්සේට විශ්වාසය ඇත. … බොහෝ ලෙස ශුද්ධාත්මයානණ්වහන්සේ සහ දෙවියන්වහන්සේගේ බලය ඇති පුද්ගලයන් අපට අවශයි[,] ... පුද්ගලයන් ගෞරවය ඇති, අවංක, දැහැමි සහ ශුද්ධවන්තයන්ය."[2]

ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කළසේක:

බලන්න දැනටමත් අස්වැන්න නෙලා ගැනීමට හැකි අයුරින් කුඹුර සුදු පාටය; සහ අහෝ, ඔහුගේ උපරිම ශක්තිය යොදවා ඔහු දෑකැත්ත තෙරපමින් කටයුතු කලහොත්, ඒහා සමානව ගබඩා කර ගැනීමට ද ඔහු විනාශ නොවන අතර, ඒවාගේම ඔහුගේ ආත්මයට ගැලවීම ගෙන එන්නේය;

"සහ ඇදහිල්ල, බලාපොරොත්තුව, දයාව සහ ප්‍රේමය, දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා පමණක් යොමුවීම, කටයුත්ත සඳහා ඔහු සුදුසුකම් ලබන්නේය" (ඩී සහ සී 4:4-5).

ඔබගේ කැඳවීම පැමිණ තිබෙන්නේ දිව්‍යමය පෙළ බවීමක් තුලිනි. දෙවියන්වහන්සේ කැඳවා ඇත්තන්, දෙවියන්වහන්සේ සුදුස්සන් කරන ලෙස, මම සාක්ෂි දරමි.

දහම සහ ගිවිසුමේ සඳහන් පරිදි, මුල් කාලපරිච්ඡේදයේදී ස්වාමීන්වහන්සේ විසින් ධර්මදූතයන්ට ලබාදුන් අලංකාරමත් පොරොන්දුව ඔබට අයිති වනු ඇත: "මම ඔබගේ ඉදිරියෙන් ගමන් කරමි. ඔබව එසවීමට, මම ඔබගේ දකුණත හා වම් පැත්තේ සිටිමි, සහ මාගේ ආත්මය ඔබගේ හදවත් තුල ද, මාගේ දේවදූතයන් ඔබ වටාද සිටින සේක" (ඩී ස හ සී 84:88).

ඔබ සේවය කරන විට, ඔබ අනර්ඝ සදාකාලික මතක සටහන් හා මිත්‍රත්වයන් ඇති කරයි. ධර්මදූත මෙමෙ හවරේ හැරෙන්න වෙන කිසියම් තැනකවත් ප්‍රීතිය නම් එලදායී අස්වැන්නක් ලබාගත නොහැකි බව මම දනිමි.

දැන්, යම්කිසි හේතුවක් හෙයින් ධර්මදූත සේවයේ නියමිත කාලසීමාවය නිමකළ නොහැකි වූ වැඩිහිටියන්, කාන්තාවන්, සහ විවාහක යුවල්, ඔබලාට වචනයක්: ස්වාමීන්වහන්සේ ඔබට ආදරේ සේක. උන්වහන්සේ ඔබගේ කැපවීම අගය කොට සලකන සේක. උන්වහන්සේ ඔබගේ දොම්නස දන්නා සේක. උන්වහන්සේ තුල ඔබ කළයුතු කටයුතු තවද ඇති බව දැනගන්න. සාතන් ඔබට වෙනත් අයුරකින් පැවසීමට ඉඩනොදෙන්න. අසතුටු නොවන්න; අධෛර්‍යයට පත් නොවන්න; බලාපොරොත්තු සුන් කරනොගන්න.

මා ප්‍රධාන සම්මන්ත්‍රනය අනුගමනය කරන විට සුළු කලකට පසු මා සභාව මගපෙන්වීමට කැඳවූසේක. "බිය නොවන්න. ධෛර්‍යයමත් වෙයල්ලා. ඔබගේ ඇදහිල්ල වාගේ ඔබගේ අනාගතයද දීප්තිමත්ය."[3] එම පොරොන්දුව තවමත් ඔබට ඇත. එබැවින් ඔබගේ ඇදහිල්ල නැති කර නොගන්න, මන්ද ස්වාමීන්වහන්සේ ඔබ කෙරෙහි ඇදහිල්ලෙන් සිටින සේක. ඔබගේ ගිවිසුම් අනුගමනය කරමින් ඉදිරියට යන්න.

යේසුස්වහන්සේගේ ශුභාරංචිය ලෝකයාට අවශ්‍යය. අප ධර්මදූත හදවතින් කොතැනක සිට සේවය කලත්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ශුද්ධවන්තයන්හට ආශිර්වාද කරත්වා.

### සටහන්

1. හීබර් සී. කිම්බල්, ඔර්සන් එෆ්. විට්නි තුල, *Life of Heber C. Kimball,* 3rd ed. (1967), 104.
2. *Teachings of Presidents of the Church: John Taylor* (2001), 73.
3. තෝමස් එස්. මොන්සන්, "Be of Good Cheer," *Liahona*, මැයි 2009, 92.

---

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

අප පූර්ණකාලීන ධර්මදූතයන් ලෙස සේවය කලත් හෝ නොකලත්, අප අවට සිටින අයට සේවය කරමින් සහ ශුභාරංචිය බෙදාගැනීමට අප එකිනෙකාට අවස්ථාවන් තිබෙන්නේය. මෙම පණිවුඩය සහ මෑතකදී පැවතුනු ප්‍රධාන සම්මන්ත්‍රණයක මාතෘකාව වන "නැවත පිහිට වූ ශුභාරංචිය" ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි ඩලින් එච්. ඕක්ස් විසින් (*Liahona,* නොවැ. 2016, 57) පැවැත්තු කථාව හා සංසන්දනය කර බලන්න. ඒවාගේම ඔබ උගන්වන අය සමග "දෙවියන්වහන්සේ කැඳවන්නන්, දෙවියන්වහන්සේ සුදුස්සන් බවට පත් කරන සේක" යන වාක්‍යය ගැන සාකච්චා කරන්න. ධර්මදූත සේවය සහ ඔවුන්ගේ කැඳවීම් ඉටුකිරීමට දෙවියන්වහන්සේ කෙසේ උපකාර කරන්නේ ද යැයි ඔවුන්ට කෙසේ හැගේද? ඔවුන්ගේ පවුලේ අය, මිතුරන් සහ අසල්වැසියන් අතර ශුභාරංචිය කෙසේ බෙදාගන්නේද යන්න දැනගැනීමට අවශ්‍යය ශක්තිය සහ පෙළඹවීම ලබාගැනීමට යාඥාකරන ලෙසට, ඔබ උගන්වන අයට ආරාධනා කළ හැකිය.

## තරුණ අය

### ලේබලය නොමැති ධර්මදූතය

කර්ස්ටි අරාව් විසින්

මාගේ පාසලේ එක් අමුතු චරිතයක් ඇති ගුරුවරයෙක් සිටී. ඔහු නිසා විෂයට අදාල ප්‍රතිවිරුද්ද අදහස් දක්වන කෙනෙක් බිය නිසා එම අදහස් දැක්වීමෙන් වැලකී සිටී. එක් දිනක් අප පසුදවස් වල ශුද්ධවන්තයන්ගේ ධර්මදූතයන් යන මාතෘකාව ගැන සාකච්චා කලේය. මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය හැකි බව මම දැන සිටියෙමි, නමුත් මම පිළිතුරු නොදිය යුතු යැයි මාහට හැගුනේය. මෙම මොහොතේ පමණක් ඔහුට සෑහීමට පත්වීමට පමණක් මා පිළිතුරු දුන්නෙමි.

මීලග සුමාන කිහිපය පුරාම මාහට අපගේ සාකච්චාව ගැන සිතීම නතර කල නොහැකි විය. අවසානයේ දී මාහට සිතුවිල්ලක් පහල විය, ධර්මදූත මෙහෙවර ගැන සඳහන් පරිච්චේද කිහිපයක් සටහන් කර මොර්මන්ගේ පොත ඔහුට දිය යුතු බව. එම සිතුවිල්ල මා බය ගැන්වූ නමුත් ඒ සිතුවිල්ල නැවත නැවත මාහට පැමිණියහ. බිය පෙළඹවීමක් සහ මා එය අනුගමනය කළ යුතු බව මා දැන සිටියෙමි.

දෙමසකට පමණ පසු, මා මොර්මන්ගේ පොත සූදානම් කර ගතිමි. මාගේ බෑගයේ මුළු දවස පුරාම පොත දැවී සිදුරක් ඇති කරන ලෙස මාහට දැණුනෙමි. එය ඔහුට දීමට ගතවූයේ තත්පර තුනකි, නමුත් මාගේ මුළු ශීතකාලයේ නිවාඩුව මාගේ ජීවිතයේ භයානකම මොහොතක් මෙන් මාහට හැගුනෙමි.

නිවාඩුවෙන් පසු පළමු දින, මම ඔහුගේ පංති කාමරය තුලට යාමට බිය හෙයින් පසුකර ගියෙමි. එවිට ඔහු මාහට කතා කර කාඩ් පතක් දුන්නේය. මා එය ශාලාවේ දී කියෙව්වෙමි. මා සලකුනු කළ පරිච්චේදයන් ඔහු අධ්‍යයනය කල බව ද මාගේ විශ්වාසය පිටුපසින් ඇති කරුණු වැටහීමට පටන්ගන්නා බව ද ඔහු ලියා තිබුනේය.

මම ශුභාරංචිය බෙදා ගැනීමට ඉතා ප්‍රමෝදමත් වන අතර මාගේ ස්වර්ගික පියාණන්වහන්සේට සේවය කිරීමට විගසින්ම ධර්මදූත මෙහෙයට යාම උදෙසා මා බොහෝ හෙයින් ප්‍රමෝදමත් වන්නෙමි.

© 2017 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ඇළුජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/16. පරිවර්තන අනුමැතිය 6/16. පරිවර්තනයයි Sinhala -97926-408

# ගිවිසුම් අනුගමනය කිරීම තුලින් පූජකවරයේ බලය

ඇදහිල්ල, පවුල, සහනය

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර බෙදාගන්නා දේවල් මොනවාදැයි සොයා දැනගන්න. සහන සමිතියේ අරමුණ තේරුම් ගැනීමෙන් දෙවියන්වහන්සේගේ දියණියන් සදාකාලික ජීවිතයේ ආශිර්වාදයන් ලබා ගැනීමට කෙසේ සූදානම් වන්නේද?*

"මාගේ පණිවුඩ නම්… පූජකවරයේ බලය මගින් ආශිර්වාද ලත් ශක්තියෙන් සෑම මොහොතකදීම, කුමන අවස්ථාවක වුවද අපට ජීවත් විය හැකිය," යැයි ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි නීල් එල්. ඇන්ඩසන් පවසයි.

"...පූජකවරයේ අනුගමනයන් උදෙසා සුදුසු ලෙස ඔබ සහභාගී වන විට, ස්වාමීන්වහන්සේ ඔබට වැඩි ශක්තිය, සාමය සහ සදාකාලික සාපේක්ෂය ලබා දෙන සේක. ඔබගේ ප්‍රශ්න කුමක් වුවත්, ඔබගේ නිවස 'පූජකවරයේ බලය මගින් ආශිර්වාද ලබන්නේය.'"[1]

පූජකත්වයේ බලය අපගේ නිවස තුලට කැදවන්නේ කෙසේ? ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි එම්. රසල් බැලඩ් අපට මතක් කර සිටී "බව්තිස්මය ලබාගෙන පසුව ස්වාමීන්වහන්සේගේ දේවමාළිගාවේ හී එනඩව්න්මන්ට් වූ අය අනර්ග සහ විශ්මජනක ආශිර්වාද ලැබීමට සුදුසුකම් ලබන්නේය. සත්‍යය වශයෙන් ම එන්ඩව්න්මන්ට් එක බලවත් ත්‍යාගයකි…[සහ] අපගේ ස්වර්ගික පියානණ්වහන්සේ උන්වහන්සේගේ බලය අපට නිර්ලෝභීව ලබා දෙන සේක." පුරුෂයන් සහ කාන්තාවන් "එන්ඩව්න්මන්ට් වන්නේ එකම සමාන බලය" මගින් බවද "එම බලය පූජකවරයේ බලය යැයි උන්වහන්සේ අපට මතක් කර දෙන සේක."[2]

සහන සමිතියේ ප්‍රධාන සභාපතිනිය වන ලින්ඩා කේ. බාටන් පවසයි: "අනෙකුත් දෑ අතරින් එක්දෙයක් වන පූජකවරයේ බලය අපගේ පවුලේ සහ නිවසේ තුල තබා ගැනීමට අප සැමෝගේ ම අභිප්‍රාය වන හෙයින්, එම බලය අපගේ ජීවිත තුලට ළඟා කර ගැනීමට අප කුමක් කළ යුතුද? පූජකවරයේ බලය තබාගැනීමට නම් පුද්ගලික ධාර්මිකතාවය අත්‍යවශය දෙයකි. "[3]

"ස්වාමීන්වහන්සේ ඉදිරිපිට අප නිහතමානී වී අපට උගන්වන ලෙස උන්වහන්සේගෙන් අසා සිටින්නේ නම්, උන්වහන්සේගේ බලය ලබා අත්දැකීමට හැකි වන අයුරු උන්වහන්සේ අපට පෙන්වාදෙන සේක," යැයි ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සභාපති රසල් එම්. නෙල්සන් පවසයි.[4]

***අමතර ශුද්ධ ලියවිලි* සහ තොරතුරු**

1 නෙපි 14:14; දහම සහ ගිවිසුම 121:36; 132:20; reliefsociety.lds.org

## සටහන්

1. නීල් එල්. ඇන්ඩසන්, "Power in the Priesthood," *Liahona*, නොවැ. 2013, 92, 95.
2. එම්. රසල් බැලඩ්, "Men and Women and Priesthood Power," *Liahona*, සැප්තැ. 2014, 36.
3. ලින්ඩා කේ. බාටන්, "Priesthood Power—Available to All," *Liahona*, ජූනි 2014, 21.
4. රසල් එම්. නෙල්සන්, "The Price of Priesthood Power," *Liahona*, මැයි 2016, 69.

***මෙය සිතා බලන්න***

අපගේ ගිවිසුම් ආරක්ෂා කිරීමෙන් අපට පූජකවරයේ බලයෙන් ආශිර්වාද

© 2017 විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. අඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/16. පරිවර්තන අනුමැතිය 6/16. පරිවර්තනයයි. Sinhala 97926 408